# පමුදී මායා පාසලට යයි




මෙතුලි පමුදිතා රණවීරගේ

# පමුදි මායා පාසලට යයි

මෙතුලි පමුදිතා රණවීරගේ

පළමු මුද්‍රණය 2023

© සියලුම හිමිකම් ඇවිරිණි

ISBN 978-624-206-932-6

කතෘගේ වෙනත් කෘති: දඟ මෙතුලි (2020)

**දුලිත මල්ලීට ....**

**සෙනෙහසින් පුදමි .**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනා ගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.

එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දශර්නයට අනුව යමින් අපගේ මහපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාටර් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාථර්නා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.10.20



එකෝමත් එක ගමක හිටියා පුංචි ළමයෙක්. එයාගේ නම පමුදි. පමුදිට හිටියේ එයාගේ ආච්චි විතරයි.

දවසක්දා එයාගේ යාලුවෙක් කැලේ තියෙන මැජික් යෂ්ටියක් ගැන කිව්වා.



පමුදිට හිතුණා ඒ මැජික් යෂ්ටිය හොයා ගන්න. ආච්චිට කියන්නේ වත් නැතුව පමුදි යෂ්ටිය තියෙනවා කිව්ව කැලේට ගියා.

ටික ටික රෑ වුණා, නමුත් පමුදි කැලේ ඇතුළටම ගිහිං!

එය රෑට නිදා ගන්න තැනක් හොයන කොට ගල් ගුහාවක් හම්බ වුණා.

ඒ ගල්ගුහාවට ඇතුල් වෙන්න හදන කොටම මායා කාරියක් එතනට ආවා

.



පමුදි බයවෙලා දුවන්න ගත්තා. නමුත් ඇය දුවන දුවන පැත්තට මායාකාරියෝ සහ තවත් මායාකාරයෝ ආවා.

පමුදි හොඳටම බය වෙලා මායාකාරියගෙන් ඇහුවා ''ඇයි ඔයගොල්ලෝ මාව පන්නන්නේ?'' කියලා.

මායාකාරිය කිව්වා ''අපි ආවේ ඔයාව මායා ඉස්කෝලෙට ගෙනියන්න, ඔයාගේ අම්මයි තාත්තයි දෙන්නම මායාකාරයෝ, ඒ ගොල්ලොත් මේ පාසැලට ගියා.

“ඔයාව එක්ක යන්න තමයි අපි ආවේ''. එක මායාකාරයෙක් කිව්වා.

''එහෙනම් මම ගෙදර ගිහිල්ලා මගේ බඩු ටික අරගෙන එන්නම්'' පමුදි කිව්වා.

''ඔයාගේ බඩු ගේන්න ඕනේ නෑ, ඔයාට අවශ්‍ය ඔක්කොම බඩු ඉස්කෝලේ තියෙනවා'' මායාකාරිය කිව්වා.

''එහෙනම් අපි දැන්මම යමු!'' පමුදි සතුටින් උඩ පැන්නා.

''ඔයාට තව ටිකක් ඉන්න වෙනවා, ඒ පාසැල හුඟක් ඈතයි, ඒ නිසා කරත්තය එනකම් අපිට ඉන්න වෙනවා.” ඒ මායාකාරයෝ කිව්වා.

ටික වෙලාවකට පසු......



''මෙන්න කරත්තය එනවා, අපි දැන් යමු '' මායාකාරිය කීවා. පමුදි සහ මායාකාරිය කරත්තයට නැඟලා යන්න පිටත් වුණා. අනිත් මායාකාරයෝ සහ මායාකාරියෝ අතුරුදහන් වුණා.

රෑ බෝ වී ගෙනත් ආවා.

''අපි දැන් ළගම ඉන්නේ, තව ටික දුරයි. අන්න ... අන්න... අර ගස්වලට උඩින් අපේ උසම කුළුන පේනවා!'' මායාකාරිය කිව්වා.

''මම දැකපු ලස්සනම තැන මෙතැන තමයි. මට හරීම සතුටුයි. බොහොම ස්තූතියි මාව ඉස්කෝලෙට එක්කගෙන ආවට.'' පමුදි කීවා.

දින ගණන් සති ගණන් ගත වුණා. පමුදිට මායා පාසලේදී ගොඩාක් යහළුවන් හමු වුණා.



ඊට පස්සේ පමුදි බොහොම සතුටින් ඉගෙන ගනිමින්, සෙල්ලම් කරමින් ජීවත් වුණා.

**පසුවදන**

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.

ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශ්වයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20